# අභිලේඛනවලින් හෙළිවන රෝහණ රාජ්‍යය

එච් . එල් . ජයශානි
විශේෂවේදී ෙ.වන වසර
ඉතිහාස අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
jayashani1127@gmail.com

**සංක්ෂේපය**

ලංකා ඉතිහාසය හැදෑරීමේදී ප්‍රාථමික මූලාශ්‍රයවලින් ලැබෙන පිටිවහල ඉතා වැදගත් වේ. ඒ අතුරින් පුරාවිද්‍යා මූලාශ්‍රයක් ලෙස සෙල්ලිපිවලට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. එය සාහිත්‍ය මූලාශ්‍රය සනාථ කිරීමට ද බෙහෙවින් උපකාරී වේ. මාගේ අරමුණ වන්නේ මෙම අභිලේඛන මඟින් රෝහණ රාජධානියේ ඓතිහාසික පසුබිම හෙළිදරව් කිරීම මෙන්ම සාහිත්‍යය වංසකතාවලින් ගිලිහී ගිය රෝහණ රාජධානියේ තතු හෙළි කිරීමයි.

මෙම අධ්‍යයනයේ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීය මූලාශ්‍රය මෙන්ම විශේෂයෙන් පුරාවිද්‍යා මූලාශ්‍රයන් පිළිබඳ අධ්‍යයනය කෙරිණි. රෝහණ රාජධානිය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා විශාල අභිලේඛන ප්‍රමාණයක් හමුවන අතර ඒවා අතුරින් ලෙන් ලිපි සංඛ්‍යාව ප්‍රමාණයෙන් වැඩිය. ඊට අමතරව පර්වත, පුවරු හා ටැම් ලිපි ගණයට අයත් ලිපි රාශියක් ද ලැබෙන අතර මෙම සෑම අභිලේඛනයකින්ම රෝහණ රාජධානියේ ඓතිහාසික තොරතුරු නිරූපණය වේ. විශේෂයෙන් මෙම රාජධානියේ පාලකයන් පිළිබඳ දැක්වීමේ දී ඔවුන්ගේ නම් සාහිත්‍ය මූලාශ්‍රයන්ට වඩා වෙනස් ස්වරූපයකින් අභිලේඛනවල දක්වා තිබේ. නාගඅය, අභිසවෙර යන නාමයන් සාහිත්‍ය මූලාශ්‍රයවල මහානාග හා විහාරමහාදේවි ලෙස දක්වා තිබේ. විශේෂයෙන්ම ලංකා ඉතිහාසයේ වැදගත් සංධිස්ථානයක් වූ මහින්දාගමනය සනාථ කිරීම සඳහා රජගල වැනි ස්ථානවලින් ලැබෙන අභිලේඛන වැදගත් වේ. එමෙන්ම මෙකල රෝහණයේ සිටි භික්ෂූන්ගේ නාමයන් ද අභිලේඛන මඟින් අනාවරණය කරගත හැකිය. මුල් කාලයේ ඉදිකෙරුණ ලෙන් ලිපි මඟින් බෙහෙවින් විහාරාරාම හා භික්ෂූන්ට ගල්ලෙන් පූජා කිරීම දක්‌ වුව ද, පසුකාලයේ ඉදි වූ අභිලේඛන මඟින් රෝහණ රාජ්‍යයේ සමස්ත දේශපාලනය ද ආගමික මෙහෙවර ද ආරක්ෂක විධි විධාන ද හඳුනාගත හැකිය. විශේෂයෙන් දුටුගැමුණු රජ පරපුර පිළිබඳව වැඩි තොරතුරු ප්‍රමාණයක් අභිලේඛන මඟින් අනාවරණය වේ. මේ අනුව අභිලේඛන රෝහණ රාජධානියේ ඓතිහාසික තොරතුරු විමර්ශනයට වැදගත් වනවා සේම සාහිත්‍යය මූලාශ්‍රය සනාථ කිරීමට ද එම මූලාශ්‍රයවල නොමැති තොරතුරු හෙළිදරව් කිරීමට ද බෙහෙවින් උපකාරී වේ .

**ප්‍රමුඛ පද :- රෝහණ රාජ්‍යය, අභිලේඛන, සාහිත්‍ය මූලාශ්‍රය**